මාධ්‍ය නිවේදන අංක 12

## මැතිවරණ කොමිෂන් සභාව

### මාධ්‍ය නිවේදනය

සාමකාමී විරෝධය දැක්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම්හි එක් කරුණක් වන අතර, මූලික අයිතිවාසිකම් යනු ජනතා පරමාධිපත්‍යයේ කොටසක් ලෙස ද සැලකේ. මෙම පසුබිම තුළ 2022 මැයි මස 09 දින ගෝල්ෆේස් පිටියේ සාමකාමී විරෝධතාවට පහර දීමත් එයින් පසුව දිවයින පුරා ඇති වූ සිද්ධීන් පිළිබඳවත් මැතිවරණ කොමිෂන් සභාව බලවත් කණගාටුවට පත්වෙයි. ගොල්ෆේස් පිටියේ සාමකාමී උද්ඝෝෂණයට පහර දීම මගින් පෙන්නුම් කරනු ලබනුයේ අප දේශපාලන සංස්කෘතියේ පවතින නොමේරූ ප්‍රචණ්ඩ හැසිරීමක් වන අතර එම සිදුවීම වළක්වා ගත හැකිව තිබූ හා වළක්වා ගත යුතු වූ සිදුවීමක් බව ද අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය පිළිගත හැකි තත්ත්වයක නොමැති බව ද මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ. එසේම ඉන් පසු දිවයින පුරා සිදු වූ මිනිස් ඝාතන,දේපල විනාශයන්, ව්‍යාපාරික ස්ථාන විනාශ කිරීම මගින් ද පෙන්නුම් කරනුයේ ද ගෝත්‍රික සමාජ ලක්ෂණ වන අතර එම සිදුවීම වැළැක්වීමේ දී ද බලධාරී ආයතන නිසි ක්‍රියාත්මක වීමක් නොපෙනෙන අතර මෙහි දී 1983 හා 1987 සිදු වූ සිදුවීම් ද සිහිපත් කරනු ලබයි. මෙම සිදුවීම් හෙළා දැකීම හෝ ප්‍රතික්ෂේප කිරීම්වලින් පමණක් වළක්වා ගැනීමට නොහැකි වන අතර ඒ සඳහා උසස් දේශපාලන සංස්කෘතියක් බිහිකර ගැනීම උදෙසා කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට හා මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව දැඩිව පෙන්නුම් කරන බව ද කොමිෂන් සභාවේ අදහසයි. එසේම ගෝල්ෆේස් පිටියේ සාමකාමී උද්ඝෝෂණයට පහරදීම සම්බන්ධව විමර්ශන ක්‍රියාවලියක් හා හඳුනා ගනු ලබන වගකිව යුතු සියලු දෙනාටම දැඩි නීතිමය පියවර ගන්නා ලෙසත්, එම සිද්ධිය පාදක කරගෙන දිවයින පුරා සිදු වූ මිනිස් ඝාතන හා දේපල විනාශයන්ට වගකිව යුතු තැනැත්තන් සම්බන්ධව ද විමර්ෂනය කර නීතිය දැඩිව ක්‍රියාත්මක කරන ලෙස ද, මෙහි දී නීතිය ක්‍රියාත්මක කිරීම අපක්ෂපාතීව හා .සාධාරණව ඉටු විය යුතු වන බව ද කොමිෂන් සභාව අවධාරණය කර සිටී. එසේම රට අර්බුදයක ගිලී ඇති මේ අවස්ථාවේ සියලුම දේශපාලන පක්ෂ, විශේෂයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ, ජනතාව මෙම අසීරු හා අති දුෂ්කර තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා එකඟතාවයකින් නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ද, එම අන්තර්කාලීන කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති මැතිවරණ නීති ප්‍රතිශෝධන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති/ ප්‍රතිපාදන සම්මත කරගනු ලබන ලෙසට ද, ඉතා ඕනෑකමින් යුතුව සියලුම දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටින අතර ඊට සක්‍රිය සහාය ලබා දෙන ලෙසට සිවිල් සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන, වෘත්තීය සමිති හා වෘත්තීක සංවිධානවලින් ද මැතිවරණ කොමිෂන් සභාව ආයාචනය කර සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි.

එච්.එම්.ටී.ඩී. හේරත්
ලේකම්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 මැයි මස 17